**අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතියේ අදියර 2 - 2023**

**---------------------------------------------------------------------**

අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතියේ අදියර 2 හි 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය අතර 2016 නොවැම්බර් 17 දින එළඹි අංක එස්.එල්-පී 115 දරන ණය ගිවිසුමේ ව්‍යාපෘති සංදේශයේ 18 පරිච්ඡේදය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය, වර්තමානයේ ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ.
ව්‍යාපෘතියේ අරමුණ වනුයේ අනුරාධපුර දිස්ත්‍රික්කය තුල ජල සැපයුම් පද්ධතියක් ඉදිකිරීම තුලින් ආරක්ෂිත පානීය ජලය සැපයීම හා ජල සම්පාදන ආවරණ ප්‍රදේශය වැඩි කිරීමත්, එමඟින් ව්‍යාපෘති ප්‍රදේශයේ සෞඛ්‍ය තත්වය හා ජීවන පරිසරය වැඩි දියුණු කිරීම් වේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 31,598 කට සමාන ජපාන යෙන් මිලියන 27,301 ක් සහ ඉන් රු.මිලියන 26,778 කට සමාන ජපාන යෙන් මිලියන 23,137 ක් ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිත ආයතනය විසින් මූල්‍යනය කිරීමට එකඟ වී තිබුණි. තවද, ව්‍යාපෘතියේ සම්පූර්ණ පිරිවැයෙන් රු.මිලියන 22,464 ට සමාන ජපන් යෙන් මිලියන 19,409 ක් ව්‍යාපෘතියේ කටයුතු සඳහා වෙන්කර ඇති අතර ඉතිරි රු.මිලියන 4,315 ට සමාන ජපන් යෙන් මිලියන 3,728 ක මුදල ව්‍යාපෘති අදියර I හි ක්‍රියාකාරකම් සඳහා වෙන්කර ඇත. ඊට අමතරව ජපාන යෙන් මිලියන 4,164 ක ට සමාන රුපියල් මිලියන 4,820 ක් සඳහා ශ්‍රී ලංකා රජය විසින් දායක විය යුතුය. තවද, ශ්‍රී ලංකා රජයෙන් ව්‍යාපෘති අදියර-II හි කටයුතු සඳහා රුපියල් මිලියන 4,733 ට සමාන ජපන් යෙන් මිලියන 4,089ක් වෙන්කර තිබුණි. ව්‍යාපෘති පළමු අදියරේ කටයුතු සඳහා ඉතිරි රුපියල් මිලියන 87කට සමාන ජපානයේ යෙන් මිලියන 75 මුදල වෙන් කර තිබුණි. ව්‍යාපෘතිය යටතේ වූ ක්‍රියාකාරකම් 2017 ජූනි මාසයේදී ආරම්භ කර තිබූ අතර 2024 ජූනි වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 මතය

මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශන මඟින් 2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය හා සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. භෞතික කාර්ය සාධනය

## 2.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

| | ව්‍යාපෘති සංරචකය | ක්‍රියාකාරකම | 2023 දෙසැම්බර් 31 දිනට | | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|---|---|
| | | | ප්‍රසම්පාදනයේ අපේක්ෂිත භෞතික කාර්ය සාධනය<br>ප්‍රතිශතය | ප්‍රසම්පාදනය විසින් ළඟා කරගෙන ඇති කාර්ය සාධනය<br>ප්‍රතිශතය | | | |
| (අ) | ජල පිරිපහදු යන්ත්‍රාගාරය සහ ඒ ආශ්‍රිත පහසුකම් ඉදිකිරීම. | ජල තුළුමුව පහසුකම්, ජල පිරිපහදු යන්ත්‍රාගාරය, ජල ගබඩා ව්‍යුහයන්, යාන්ත්‍රික විදුලි හා ගොඩනැගිලි වැඩ ඉදිකිරීම - (ලොට් අංක - ඒ) | 100 | 74 | මේ සම්බන්ධයෙන් ලංසු ලේඛන නිකුත් කර පූර්ව ලංසු පරීක්ෂාවන්සහ පූර්ව ලංසු රැස්වීම් 2022 අප්‍රේල් මාසයේදී අවසන් කළද ජපන් සහයෝගිතා ආයතනය මුදල් ලබා දීම තාවකාලිකව අත්හිටුවීම හේතුවෙන් ලංසුව අවසන් කිරීම දින නියමයක් නොමැතිව දීර්ඝ කරන ලදී. | රටෙහි පවතින ගැටළුකාරී තත්ත්වය හේතුවෙන් සහ ජපන් සහයෝගිතා ආයතනය විසින් අරමුදල් සහ එකඟතාවයන් ලබා දෙන තෙක් ලංසු ඉදිරිපත් කිරීම අවසන් කරන දිනය දින නියමයක් නොමැතිව දීර්ඝ කිරීම සිදුකර ඇත. | ව්‍යාපෘති කටයුතු නැවත ආරම්භ කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් නල සැපයීම හා ඇතිරීම. | ඩීඅයි, ඉහළ ඝනත්ව පොලිඑතිලීන් සම්ප්‍රේෂණ සහ ඉහළ ඝනත්ව පොලිඑතිලීන් ප්‍රධාන බෙදාහැරීමේ ජාලයන් සඳහා නළ සැපයීම සහ ඇතිරීම. (ලොට් අංක - බී)<br>සහ පදවිය, කැබෙතිගොල්ලෑව , කහටගස්දිගිලිය, හොරොව්පොතාන සහ රබාව | 100 | 93 | ජපන් සහයෝගිතා ආයතනය මුදල් ලබා දීම තාවකාලිකව අත්හිටුවීම හේතුවෙන් මෙම සංරචකය සඳහා ලංසු තැබීමේ පටිපාටිය ලංසු ඇගයීමේ අදියරේදී තාවකාලිකව අත්හිටුවා තිබුණි. | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය / කැබිනට් මණ්ඩලය පත් කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටු (SCAPC) තීරණවලට අනුව, ලංසු වලංගු කාලය සහ ලංසු ආරක්ෂණ කාලය පිළිවෙලින් 2024.04.01 සහ 2024.04.28 දක්වා දීර්ඝ කරන ලදී. | ව්‍යාපෘති කටයුතු නැවත ආරම්භ කිරීමට පියවර ගත යුතුය. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා ඉහළ ඝනත්ව පොලිඑතිලීන්, ඩීඅයි බෙදාහැරීමේ ජාලයන් සඳහා නළ සැපයීම සහ ඇතිරීම සහ සේවා සම්බන්ධතා සැපයීම. | | | | | |
| (ඈ) | සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් නල සැපයීම හා ඇතිරීම. | සේවා සම්බන්ධතා සැපයීම, ඉහළ ඝනත්ව පොලිඑතිලීන් බෙදා හැරීමේ නල මාර්ග සැපයීම සහ ඇතිරීම, සහ ධාරිතාව 250 ක ජල කුළුණක් ඉදිකිරීම (අදියර -I සඳහා ලොට් අංක - සී 3) | 100 | 77 | මෙම ඉදිකිරීම සඳහා 2021 නොවැම්බර් 17 වැනි දින ලංසු කැඳවා 2022 ජනවාරි 26 දින ලංසු කැඳවීම අවසන් කළද, දැනට ජපන් සහයෝගිතා ආයතනය මුදල් ලබා දීම තාවකාලිකව අත්හිටුවීම හේතුවෙන් එය ලංසු ඇගයීමේ අදියරේ පවතී. | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය / කැබිනට් මණ්ඩලය පත් කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටු තීරණවලට අනුව, ලංසු වලංගු කාලය සහ ලංසු ආරක්ෂණ කාලය පිළිවෙලින් 2024.04.01 සහ 2024.04.28 දක්වා දීර්ඝ කරන ලදී. | මෙම සංරචකයේ වැඩ නැවත ආරම්භ කිරීමට පියවර ගත යුතුය. |
| (ඈ) | ඉදිකිරීම් අධීක්ෂණය සඳහා උපදේශන කොන්ත්‍රාත්තුව (ලොට් අංක -එෆ්) | ඉදිකිරීම් අධීක්ෂණය සඳහා උපදේශන කොන්ත්‍රාත්තුව (ලොට් අංක -එෆ්) | 100 | 91 | ජපන් සහයෝගිතා ආයතනය මුදල් ලබා දීම තාවකාලිකව අත්හිටුවීම හේතුවෙන් සාරානුකූල උපදේශකයා සමඟ සාකච්ඡා රැස්වීම් පවත්වා නොමැත. දැනට, කොන්ත්‍රාත්තුව ලංසු ඇගයීමේ අදියරේ පවතී. | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය / කැබිනට් මණ්ඩලය පත් කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටු තීරණවලට අනුව, ලංසු වලංගු කාලය 2024.04.01 දක්වා දීර්ඝ කරන ලදී. | ව්‍යාපෘති කටයුතු නැවත ආරම්භ කිරීමට පියවර ගත යුතුය. |
| (ඉ) | ඉඩම් අත්පත් කර ගැනීම සහ ඉඩම් නිෂ්කාශනය කිරීම | ඉඩම් අත්පත් කර ගැනීම සහ ඉඩම් නිෂ්කාශනය කිරීම | 100 | 76 | මහවැලි අධිකාරියට සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් කොටස් පහ සඳහා දීර්ඝ කාලීන බදු දීමට | අදාළ බලධාරීන් විසින් බදු දීමේ කටයුතු සිදු කෙරෙන අතර මෙමගින් ව්‍යාපෘති කටයුතුවල | ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු අවසන් කිරීමට කටයුතු කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | | අදාළ කටයුතු 2023 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි. | ප්‍රමාදයක් සිදු නොවේ. |

**3.** **මතභේදයට තුඩු දුන් කරුණු**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| මෙම ව්‍යාපෘතිය මගින් දන්ත හා අස්ථි ෆ්ලෝරෝසිස් ඇති කරන එමෙන්ම නිදන්ගත වකුගඩු රෝගය පැතිරීම සඳහා ප්‍රධාන අන්තරායකාරී සාධකයක්ද වන අනාරක්ෂිත දූෂිත භූගත ජලයෙන් යැපෙන කැබිතිගොල්ලෑව, පදවිය, හොරොව්පොතාන සහ කහටගස්දිගිලිය ප්‍රාදේශීය ලේකම් ප්‍රදේශ ආවරණය කරයි. එබැවින් ආරක්ෂිත පානීය ජලය සැපයීම සඳහා මෙම ජල සම්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට රජය ප්‍රමුඛත්වය දී ඇති අතර ව්‍යාපෘතිය 2017 ජුනි මස සිට ආරම්භ කර 2024 ජුනි මස අවසන් කිරීමට නියමිතව තිබුණි. පවුල් 50,000ක් ප්‍රතිලාභීන් ලෙස ඉලක්ක කර සුරක්ෂිත පානීය ජලය ලබාදීමට අපේක්ෂා කළ ද මාස 78ක් ගතවී ඇතත් මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව මෙතෙක් ලබාදී නොමැත. එහි ප්‍රතිඵලයක් ලෙස සියලුම ක්‍රියාකාරකම් ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ පැවති අතර අරමුදල් නොමැතිකම හේතුවෙන් ව්‍යාපෘති කටයුතු අත්හිටුවා ඇත. එබැවින් ප්‍රතිලාභීන්ගේ අපේක්ෂාවන් ඉටුකර ගැනීමට නොහැකි වූ අතර ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ ඉලක්කගත ප්‍රතිලාභීන් වෙත ළඟා කර ගැනීමේ අවදානමක් ඇතිවී තිබුණි. | ජපන් සහයෝගිතා ආයතනය විසින් 2022 අප්‍රේල් මාසයේ සිට සියලුම ණය වාරික ලබා දීම සහ එකඟතා සැපයීම තාවකාලිකව අත්හිටුවා ඇත, එබැවින් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම තවදුරටත් ප්‍රමාද වනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු. | අවශ්‍යය ප්‍රතිපාදන සොයා ගනිමින් ව්‍යාපෘතිය අවසන් කිරීමට කටයුතු කළ යුතුයි. |